# <u>මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත: ට්‍රෝජන් අශ්වයෙක්</u>

වර්ෂ 2023 සැප්තැම්බර් මස 18 වන දින, ශ්‍රී ලංකා රජය විසින් ''මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය'' නමින් පනත් කෙටුම්පතක් ප්‍රකාශයට පත් කරන ලද අතර, පසුව මෙය ඔක්තෝබර් 3 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මෙම පනත් කෙටුම්පතේ අරමුණ වන්නේ නොපැහැදිලි ලෙස අර්ථ දක්වා ඇති "තහනම් ප්‍රකාශ" අන්තර්ජාල වේදිකාවලින් ඉවත් කිරීමට පුද්ගලයන්ට සහ අන්තර්ජාල සේවා සපයන්නන්ට නියම කිරීමේ හැකියාව ඇතුළු බලතල රාශියක් සහිත මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවීමයි. පෙනෙන්නට තිබෙන ආකාරයට, වික්‍රමසිංහ ප්‍රමුඛ ආණ්ඩුව මෙම පනත් කෙටුම්පත නීතිගත කිරීමට අධිෂ්ඨාන කර ඇති අතර, මෙම තත්ත්වය යටතේ ශ්‍රී ලාංකේය අන්තර්ජාල අවකාශය දණ්ඩනීය නියාමනයකට ලක් කිරීම තුළ නිදහස් භාෂණය සහ විසම්මුතිය ප්‍රකාශකිරීම සම්බන්ධයෙන් උද්ගතවන ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව විමසා බැලිය යුතුය. මෙහිදී සැලකිය යුතු කරුණක් වන්නේ, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත මගින් ජාතික ආරක්ෂාවට හෝ මහජන සාමයට බාධා කිරීමේ අනතුරක් සහිත හෝ විවිධ සමූහයන්ට අයත් තැනැත්තන් අතර ''එදිරිවාදී'' හෝ ''වෛරී හැඟීම්'' ප්‍රවර්ධනය කළ හැකි පුද්ගලයන් සිරගත කිරීමට සහ/හෝ දඩ නියම කිරීමට බලාපොරොත්තු වෙයි. තවද, මූලික අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පුළුල් ගැටලුකාරී තත්ත්වයන් ජනිත කළ හැකි "ආගමික හැඟීම් නිග්‍රහයට පාත්‍ර කළ හැකි" හෝ මහජනතාවට ''බියක්'' හෝ ''තැතිගැන්මක්'' ඇති කරන ප්‍රකාශයන් සහිත මාර්ගගත සන්නිවේදනයන් තහනම් කිරීමට විධිවිධාන මෙම පනත් කෙටුම්පතෙහි පවතී. අනෙක් අතට, මෙම පනත් කෙටුම්පතේ නිර්මාපකයන් එය ළමා කාමුක දර්ශනවලට එරෙහිව කටයුතු කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසන අන්දමේ එකක් ලෙස පැසසුමට ලක් කර ඇත. කෙසේ වෙතත්, දැනට පවතින නීති වල දැනටමත් විධිවිධාන සපයා ඇති මෙම වැරදි, පනත් කෙටුම්පතේ සුළු කොටසක් වන අතර අන්තර්ජාලය හරහා කාන්තාවන් සහ ළමුන් මුහුණ දෙන අපචාර මැඬලීමේ ඉටු කිරීමට එය ප්‍රමාණවත් නොවේ.

මෙම පනත් කෙටුම්පත ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අඩංගු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන බවට තර්ක කරමින් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කර ඇති පෙත්සම් 45 ක් මගින් සිවිල් සමාජය සහ වෙනත් පුද්ගලයන් මෙම පනත් කෙටුම්පත විවේචනයට ලක්කර ඇති අතර එය සම්මත කළ හැක්කේ ජනමත විචාරණයකින් පමණක් බවටද තර්ක කරනු ලැබ ඇත. වර්ෂ 2023 නොවැම්බර් 7 වන දින වන විට අධිකරණය තීන්දු කලේ, ප්‍රසිද්ධියේ ඉදිරිපත් කරන ලද දේවල විෂය පථය සැලකිය යුතු ලෙස වෙනස් කරමින්, පනත් කෙටුම්පතට සංශෝධන 31ක් සිදු කළහොත් පමණක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාය පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කළ හැකි බවටය.

එපමණක් නොව, වරෙක මහජන ආරකaෂාව පිළිබඳ අමාත්‍යවරයා මෙම පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගෙන සංශෝධිත පිටපතක් ඉදිරිපත් කරන බවට පොරොන්දු වුවද, පනත් කෙටුම්පත 2024 ජනවාරි 23 වැනි දින පාර්ලිමේන්තුවේදී විවාදයට ගැනීමට නියමිතය. නීතිය පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අපයෝජන වැළැක්වීමට අවශ්‍ය කරන විධිවිධාන ඇති බව සහතික කිරීම සඳහා මහජනතාව සහ අනෙකුත් අය සමඟ සම්බන්ධව කටයුතු කිරීමට රජය විසින් සැබෑ උනන්දුවක් නොදක්වන බවට වන බොහෝ ගැටලුකාරී තත්ත්වයන් පවතින පසුබිමකදී මෙය මෙසේ සිදු වේ.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත ඉදිරිපත් වූ කාල වකවානුව ද සැලකිය යුතු ය. 2023 වසරේ අවසන් මාස කිහිපය තුළ, ශ්‍රී ලංකා රජය, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතට අමතරව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට මතභේදාත්මක  ප්‍රති ත්‍රස්ත පනත් කෙටුම්පතක් සහ විකාශනයන්හි අන්තර්ගතය නියාමනය කිරීම සඳහා විකාශන නියාමන අධිකාරියක් පිහිටුවීම සඳහා වූ පනතක් ද ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. මේ අනුව, අපගේ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි භයංකර බලපෑමක් ඇති කරමින් සිතීමේ සහ ප්‍රකාශනයේ නිදහස සීමා කිරීම සඳහා පවතින පුළුල් නීති ජාලයකට මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත ද හොඳින් ගැළපෙන බව පෙන්නුම් කෙරේ.

ඉහත පෙන්වාදුන් ගැටලුකාරී තත්ත්වයන් පවතින්නේ සාමාන්‍ය ජනතාව තුළ පවතින දැනුවත්භාවයේ ඌනතාවක් පවතින සන්දර්භයක ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් 2023 වසරේ නොවැම්බර් මාසයේදී පවත්වන ලද මත විමසුමකින් හෙළි වූයේ යෝජිත මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රී ලාංකික ජනතාවගෙන් 28.4%ක් පමණක් දන්නා බවත්, බලයේ සිටින අය තමන්ගේ වාසියට මෙම පනත් කෙටුම්පත අවභාවිත කරනු ඇති බව පවසමින් මෙම සංඛ්‍යාවෙන් 71.1%ක් පනත අනුමත නොකරන බවත්ය. මෙම පනත් කෙටුම්පත ප්‍රකාශයට පත් කිරීමට පෙර පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමේ හා උපදේශන ලබා ගැනීමේ අඩුවක් පෙන්වීමේ රටාවක් පිළිබිඹු කරන අතර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත වැනි නීතීන් විවේචකයන්, සුළු ජාතීන් සහ වෙනත් අය ඉලක්ක කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කිරීමේ සන්දර්භය තුළ යොදාගනු ලැබීම සැලකිල්ලට ලක්විය යුතුය. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 71.6%ක් මෙම පනත් කෙටුම්පත ගැන නොදැන සිටීමත් සමඟ, මහජනතාවගෙන් බහුතරයක් ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ මූලික අයිතිවාසිකම අගතියට පත්කරන මුලපිරීම් නොසලකා හරින බවට පැහැදිලි ලකුණක් තිබේ.

මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් නීතියක් බවට පනවනු ලැබුවහොත්, අන්තර්ජාලය හරහා ආරක්ෂිත අවකාශයන් ලබා දීමේ මුවාවෙන් ඇත්ත වශයෙන්ම විවේචනාත්මක මහජන මතය වාරණය කිරීමට සහ විරුද්ධ දේශපාලන හඬවල්වල් සහිත විසම්මුතිය මැඩපැවැත්වීමට 'මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පිළිබඳ කොමිෂන් සභාවක්' බල ගැන්වීම සිදු කෙරෙන අඩුපාඩු සහිත නීතියක් පමණක් ජනතාවට ලැබේ. මහජනතාවට එබඳු අහිතකර හා හානිදායක අනාගතයක් උදා නොවිය යුතුය යන බලාපොරොත්තුව දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තීරණය මත රඳා පවතී.